IPRC/16/211

# පැරණි ලක්දිව පැවති රෝග හා ප්‍රතිකාර විධි පිළිබඳව විමර්ශනයක් (අනුරාධපුර හා පොළොන්නරු යුග ඇසුරෙන්)

සුධර්මා ප්‍රේමසිරි[1*]

''ආරෝග්‍යා පරමා ලාභා'' යනු බුදුන් වහන්සේගේ දේශනාවන්හි අන්තර්ගත වන්නා වූ සුවිශේෂී ඉගැන්වීමකි. ඒ අනුව අතීත ලාංකීය ජනයා ද නිරෝගිකම පරම ලාභයක් ලෙස සිතා කටයුතු කළ බව ඉතිහාසගත තොරතුරු අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ. නිරෝගිභාවය උතුම් සුවයක් වශයෙන් සැලකෙන අතර මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් යනාදියට අමතරව වෛද්‍ය අංශය සඳහා ද හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. මිනිසාගේ අනෙකුත් සියලු ම අංශයන්හි තීරකයා බවට පත් වනුයේ නිරෝගී බවයි. මේ හේතුවෙන් අතීත ලාංකිකයා නිරෝගී බව කෙරෙහි සැලකිලිමත් වන්නට ඇතැයි හමුව තිබෙන සාධක ඇසුරින් උපකල්පනය කළ හැකිය. වර්තමාන සමාජයේ වුව ද සෞඛ්‍ය මිනිසාගේ මූලික අවශ්‍යතාවලින් ප්‍රධාන වන අංශයක් වශයෙන් නම් කර ඇත්තේ ද නිරෝගිභාවය උතුම් සුවයක් වන නිසා වන්නට ඇතැයි සිතිය හැකිය. වසර දහස් ගණනක ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව තුළ ක්‍රමයෙන් වර්ධනය වූ දියුණු වෛද්‍ය ක්‍රමයක් පැවති බවට ඉතිහාසගත තොරතුරු හමු වේ.

අතීත ලාංකීය සමාජයේ පැවති රෝග මොනවාද? ඒ සඳහා භාවිතා කළ ප්‍රතිකාර විධි මොනවාද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වේ. එහිදී උණ, වසංගත, අතීසාර, චර්ම රෝග ආදී නොයෙකුත් රෝග සඳහා විවිධ ප්‍රතිකාර ක්‍රම භාවිතයට ගෙන තිබුණි. ඒ අතර බෙහෙත් ඖරු භාවිතය, ජන්තාඝර භාවිතය මඟින් සිදු කළ ස්වේද ප්‍රතිකාරය, ශල්‍ය කර්ම සිදු කිරීම, පුහුණු වෙද කර්මය භාවිතයට ගැනීම, ආගමික සහ වෙනත් ක්‍රමෝපායන් යොදා ගත් බවට සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක සාධක හමු වේ. මෙහි දී අධ්‍යයන කාල පරාසය ලෙස අනුරාධපුර හා පොළොන්නරු යුගය යොදා ගත් අතර මහාවංසය, දීපවංසය, අභිලේඛන වැනි ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන් ම ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය ද පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි. ලක්දිව පැවති රෝග සඳහා ඉතා උසස් මට්ටමේ ප්‍රතිකාර විධි භාවිතයට ගෙන තිබෙන බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද -*** *වෛද්‍යවරයා, ප්‍රතිකාර, ආරෝග්‍යශාලා, රාජ්‍ය අනුග්‍රහය, නිරෝගිභාවය*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. * jspsudarma@gmail.com